(අටවැනි පාර්ලිමේන්තුව - තෙවැනි සභාවාරය)

**අංක 51.**]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2019 අප්‍රේල් 02** වැනි අඟහරුවාදා **පූ.භා. 9.30** ට

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **කරු ජයසූරිය මහතා,** කථානායකතුමා

ගරු **ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

ගරු **සෙල්වම් අඩෛක්කලනාදන් මහතා,** නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමා

---

ගරු **රනිල් වික්‍රමසිංහ මහතා,** අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමා

ගරු **තලතා අතුකෝරල මහත්මිය,** අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමිය

ගරු **වජිර අබේවර්ධන මහතා,** අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා

ගරු **ජෝන් අමරතුංග මහතා,** සංචාරක සංවර්ධන, වනජීවී සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා

ගරු **ගයන්ත කරුණාතිලක මහතා,** ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **රවී කරුණානායක මහතා,** විදුලිබල, බලශක්ති සහ ව්‍යාපාර සංවර්ධන අමාත්‍යතුමා

ගරු **අකිල විරාජ් කාරියවසම් මහතා,** අධ්‍යාපන අමාත්‍යතුමා

ගරු **ලක්ෂ්මන් කිරිඇල්ල මහතා,** රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **මනෝ ගනේසන් මහතා,** ජාතික ඒකාබද්ධතා, රාජ්‍ය භාෂා, සමාජ ප්‍රගති සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමා

ගරු **දයා ගමගේ මහතා,** ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමා

ගරු **පලනි දිගම්බරම් මහතා,** කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමා

ගරු **නවීන් දිසානායක මහතා,** වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා

ගරු **ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,** බුද්ධ ශාසන හා වයඹ සංවර්ධන අමාත්‍යතුමා

ගරු **හරින් ප්‍රනාන්දු මහතා,** විදුලි සංදේශ, විදේශ රැකියා සහ ක්‍රීඩා අමාත්‍යතුමා

ගරු **සජිත් ප්‍රේමදාස මහතා,** නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා

ගරු **චන්ද්‍රානි බණ්ඩාර මහත්මිය,** කාන්තා හා ළමා කටයුතු සහ වියළි කලාප සංවර්ධන අමාත්‍යතුමිය

ගරු **ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා,** රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යතුමා

ගරු **රිසාඩ් බදියුදීන් මහතා,** කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන් වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම, සමුපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍යතුමා

ගරු **තිලක් මාරපන මහතා,** විදේශ කටයුතු අමාත්‍යතුමා

ගරු **සාගල රත්නායක මහතා,** වරාය හා නාවික කටයුතු සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමා

ගරු **අර්ජුන රණතුංග මහතා,** ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා

ගරු **පාඨලී චම්පික රණවක මහතා,** මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමා

ගරු **මලික් සමරවික්‍රම මහතා,** සංවර්ධන උපාය මාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා

ගරු **මංගල සමරවීර මහතා,** මුදල් අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා,** සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා

ගරු **රවුෆ් හකීම් මහතා,** නගර සැලසුම්, ජලසම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යතුමා

ගරු **අබ්දුල් හලීම් මහතා,** තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යතුමා

ගරු **කබීර් හෂීම් මහතා,** මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමා

ගරු **පී. හැරිසන් මහතා,** කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,** අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන ආර්ථික ප්‍රතිසංස්කරණ සහ පොදු සැපයීම් අමාත්‍යතුමා

ගරු **අජිත් පී. පෙරේරා මහතා,** අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන ඩිජිටල් යටිතල පහසුකම් හා තොරතුරු තාක්ෂණ අමාත්‍යතුමා

ගරු **රුවන් විජයවර්ධන මහතා,** අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන ජනමාධ්‍ය අමාත්‍යතුමා සහ ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **රවීන්ද්‍ර සමරවීර මහතා,** අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමා

ගරු **සුජීව සේනසිංහ මහතා,** අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා

ගරු **අශෝක් අබේසිංහ මහතා,** ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජේ. සී. අලවතුවල මහතා,** අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **රංජිත් අලුවිහාරේ මහතා,** සංචාරක සංවර්ධන, වනජීවී හා ක්‍රිස්තියානි ආගමික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **වසන්ත අලුවිහාරේ මහතා,** කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ෆයිසාල් කාසිම් මහතා,** සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලකී ජයවර්ධන මහතා,** නගර සැලසුම් හා ජල සම්පාදන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නිරෝෂන් පෙරේරා මහතා,** ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඒ. ඩී. ප්‍රේමදාස මහතා,** විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සෙය්යිඩ් අලී සාහීර් මවුලානා මහතා,** සමාජ සවිබලගැන්වීම් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විජයකලා මහේස්වරන් මහත්මිය,** අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **අජිත් මාන්නප්පෙරුම මහතා,** මහවැලි සංවර්ධන හා පරිසර රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **රන්ජන් රාමනායක මහතා,** මහාමාර්ග හා මාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **වඩිවේල් සුරේෂ් මහතා,** වැවිලි කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අමීර් අලි සිහාබ්දීන් මහතා,** කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **එච්. එම්. එම්. හරීස් මහතා,** පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) අනෝමා ගමගේ මහත්මිය,** ඛනිජ තෙල් සම්පත් සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමිය

ගරු **එඩ්වඩ් ගුණසේකර මහතා,** ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නලින් බණ්ඩාර ජයමහ මහතා,** සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **බුද්ධික පතිරණ මහතා,** කර්මාන්ත හා වාණිජ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **කරුණාරත්න පරණවිතාන මහතා,** නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු නියෝජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **හෙක්ටර් අප්පුහාමි මහතා**

ගරු **රෝහිත අබේගුණවර්ධන මහතා**

ගරු **මහින්ද යාපා අබේවර්ධන මහතා**

ගරු **ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**

ගරු **මහින්ද අමරවීර මහතා**

ගරු **තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**

ගරු ලසන්ත අලගියවන්න මහතා

ගරු ඩලස් අලහප්පෙරුම මහතා

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා

ගරු (ආචාර්ය) එස්. එම්. මොහමඩ් ඉස්මායිල් මහතා

ගරු ටී. බී. ඒකනායක මහතා

ගරු අ. අරවින්ද් කුමාර් මහතා

ගරු වේලු කුමාර් මහතා

ගරු නාලක ප්‍රසාද් කොලොන්නෙ මහතා

ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා

ගරු චන්දිම ගමගේ මහතා

ගරු නිහාල් ගලප්පත්ති මහතා

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා

ගරු එස්. එම්. චන්ද්‍රසේන මහතා

ගරු ඩී. වී. චානක මහතා

ගරු සිසිර ජයකොඩි මහතා

ගරු මලිත් ජයතිලක මහතා

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා

ගරු අනුරාධ ජයරත්න මහතා

ගරු පියංකර ජයරත්න මහතා

ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු දයාසිරි ජයසේකර මහතා

ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා

ගරු ක. තුරෙයිරෙත්නසිංහම් මහතා

ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා

ගරු එම්. එස්. තෞෆික් මහතා

ගරු සිරිනාල් ද මෙල් මහතා

ගරු පියල් නිශාන්ත ද සිල්වා මහතා

ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා

ගරු අනුර දිසානායක මහතා

ගරු විමලවීර දිසානායක මහතා

ගරු වීරකුමාර දිසානායක මහතා

ගරු සාලින්ද දිසානායක මහතා

ගරු ඩග්ලස් දේවානන්ද මහතා

ගරු එස්. බී. නාවින්න මහතා

ගරු මනූෂ නානායක්කාර මහතා

ගරු වාසුදේව නානායක්කාර මහතා

ගරු මුහම්මදු නසීර් මහතා

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා

ගරු කේ. කේ. පියදාස මහතා

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා

ගරු ඩිලාන් පෙරේරා මහතා

ගරු සනත් නිශාන්ත පෙරේරා මහතා

ගරු ලක්ෂ්මන් වසන්ත පෙරේරා මහතා

ගරු සුජිත් සංජය පෙරේරා මහතා

ගරු අශෝක ප්‍රියන්ත මහතා

ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය

ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා

ගරු පාලිත රන්ගේ බණ්ඩාර මහතා

ගරු ශාන්ත බණ්ඩාර මහතා

ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා

ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා

ගරු තාරානාත් බස්නායක මහතා

ගරු තාරක බාලසූරිය මහතා

ගරු විජිත බේරුගොඩ මහතා

ගරු මුහම්මදු ඉබ්රාහිම් මුහම්මදු මන්සූර් මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා

ගරු නිශාන්ත මුතුහෙට්ටිගමගේ මහතා

ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා

ගරු සීනිතම්බි යෝගේස්වරන් මහතා

ගරු බිමල් රත්නායක මහතා

ගරු **සී. බී. රත්නායක මහතා**

ගරු **ලොහාන් රත්වත්තේ මහතා**

ගරු **ප්‍රසන්න රණතුංග මහතා**

ගරු **ප්‍රසන්න රණවීර මහතා**

ගරු **ඉෂාක් රහුමාන් මහතා**

ගරු **මුජිබුර් රහුමාන් මහතා**

ගරු **හර්ෂණ රාජකරුණා මහතා**

ගරු **චමල් රාජපක්ෂ මහතා**

ගරු **නාමල් රාජපක්ෂ මහතා**

ගරු **මහින්ද රාජපක්ෂ මහතා,** පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

ගරු **අංගජන් රාමනාදන් මහතා**

ගරු **ගාමිණී ලොකුගේ මහතා**

ගරු **පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය**

ගරු **විදුර වික්‍රමනායක මහතා**

ගරු **(ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා**

ගරු **ඒ. ඒ. විජේතුංග මහතා**

ගරු **ලක්ෂ්මන් ආනන්ද විජේමාන්න මහතා**

ගරු **(වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය**

ගරු **රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**

ගරු **ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය**

ගරු **චමින්ද විජේසිරි මහතා**

ගරු **ධුලිප් විජේසේකර මහතා**

ගරු **හේෂා විතානගේ මහතා**

ගරු **තේනුක විදානගමගේ මහතා**

ගරු **චන්දිම වීරක්කොඩි මහතා**

ගරු **විමල් වීරවංශ මහතා**

ගරු **කුමාර වෙල්ගම මහතා**

ගරු **එස්. ශ්‍රීතරන් මහතා**

ගරු **ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**

ගරු **ජයන්ත සමරවීර මහතා**

ගරු **මහින්ද සමරසිංහ මහතා**

ගරු **සන්දිත් සමරසිංහ මහතා**

ගරු **ඊ. සරවනපවන් මහතා**

ගරු **ධර්මලිංගම් සිද්ධාර්ථන් මහතා**

ගරු **මුත්තු සිවලිංගම් මහතා**

**ගරු ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මහතා**

**ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා**

**ගරු මාවෛ සෝ. සේනාධිරාජා මහතා**

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**

**ගරු විජිත් විජයමුණි සොයිසා මහතා**

**ගරු ඩී. එම්. ස්වාමිනාදන් මහතා**

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**

**ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා**

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**

**ගරු කනක හේරත් මහතා**

**ගරු ඒ. එච්. එම්. ෆවුසි මහතා**

ධම්මික දසනායක මහතා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

නීල් ඉද්දවල මහතා, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

කුෂානි රෝහණදීර මහත්මිය, සහකාර මහ ලේකම්

ටිකිරි කේ. ජයතිලක මහතා, සහකාර මහ ලේකම්

**කල්තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. කථානායකවරයා මූලාසනාරූඪ විය.**

**1. ලිපිලේඛනාදිය පිළිගැන්වීම :** (1) කථානායකවරයා විසින්, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 35(3) වගන්තිය ප්‍රකාරව, විගණකාධිපතිවරයා විසින් කථානායකවරයා වෙත ඉදිරිපත් කරන ලද, 2019 වර්ෂය සඳහා ජාතික විගණන කාර්යාලයේ වාර්ෂික කාර්ය වැඩසටහන පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

(2) කථානායකවරයා විසින්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව,

(i) 2015 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ නවවැනි කාණ්ඩයේ IX කොටස;

(ii) 2016 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ නවවැනි කාණ්ඩයේ VIII කොටස; සහ

(iii) 2017 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ IX, X හා XI කොටස්, තෙවැනි කාණ්ඩයේ IV කොටස, නවවැනි කාණ්ඩයේ I කොටස සහ දසවැනි කාණ්ඩයේ XXXIII සහ XXXIV කොටස්

පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තා **සභා මේසය** මත තිබිය යුතුයැයි ද, මුද්‍රණය කළ යුතු යැයිද නියෝග කරන ලදී.

(3) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්, 2016 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව පිළිගන්වා, එම වාර්තාව අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**2. කාරක සභා වාර්තා පිළිගැන්වීම** : රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපති ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා වෙනුවෙන් එහි සාමාජික මන්ත්‍රී ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා විසින්, එම කාරක සභාව වෙත යොමු කරන ලද,

(i) (235 අධිකාරය) රේගු ආඥා පනත යටතේ යෝජනාව;

(ii) 2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ නියෝගය; සහ

(iii) 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමයන්

සම්බන්ධයෙන්වූ එම කාරක සභාවේ වාර්තාව පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

**3. මහජන පෙත්සම් පිළිගැන්වීම :**

(1) පස්යාල, කලල්පිටිය, මැදලන්ද වත්ත, අංක 233/26/බී දරන ස්ථානයෙහි පදිංචි ඉන්ද්‍රජිත් රවීන්ද්‍ර බස්නායක මහතාගෙන් ලැබුණු 2018.10.06 දිනැති පෙත්සම ගරු නිහාල් ගලප්පත්ති මහතා විසින් පිළිගන්වන ලදී.

(2) කොස්ගම, සාලාව, "ඇතුගල නිවස" යන ලිපිනයෙහි පදිංචි එන්. ඩබ්ලිව්. ඒ. පද්මදයා මහත්මියගෙන් ලැබුණු 2019.02.18 දිනැති පෙත්සම ගරු විදුර වික්‍රමනායක මහතා විසින් පිළිගන්වන ලදී.

(3) පේරාදෙණිය, උඩර්රියගම, ප්‍රගති මාවත, අංක 35 B / 2 දරන ස්ථානයෙහි පදිංචි එම්. කේ. බී. හේරත් මහතාගෙන් ලැබුණු 2018.08.08 දිනැති පෙත්සම ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා විසින් පිළිගන්වන ලදී.

30 (10) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

**4. අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා (අංක 1)** : පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කරන ලද යෝජනාව,— 2019 ජනවාරි 24 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවෙහි කුමක් සඳහන්ව තිබුණ ද, 2019 මාර්තු 28 වැනි දින තේරීම් කාරක සභාව විසින් තීරණය කළ පරිදි පහත සඳහන් අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවන්හි නාමයන්,

(i) මුදල් හා ජනමාධ්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව මුදල් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව ලෙසත්;

(ii) ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන සහ යෞවන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව ලෙසත්; සහ

(iii) කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන්වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම සහ සමුපකාර සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන්වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම සහ සමුපකාර සංවර්ධන හා වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව ලෙසත්;

නැවත නම් කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**5. අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා (අංක 2) :** පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කරන ලද යෝජනාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 112 (1) හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, 2019 මාර්තු 28 වැනි දින තේරීම් කාරක සභාව විසින් තීරණය කළ පරිදි ජනමාධ්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවක් වශයෙන් පත් කළ යුතුය.

එකී කාරක සභාව වෙත යොමු කරනු ලබන කරුණු සම්බන්ධයෙන් සාකච්ඡා කර බලා වාර්තා කිරීම සඳහා විෂය භාර අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන අමාත්‍යවරයා සභාපතිවරයා වූ ද, රාජ්‍ය අමාත්‍යවරයා, නියෝජ්‍ය අමාත්‍යවරයා සහ තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන වෙනත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් පස් දෙනෙකුගෙන් (05) සමන්විත විය යුතු ය.

එකී අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ ගණපූරණය සාමාජික මන්ත්‍රීවරයන් තුන් දෙනෙකුගෙන් (03) සංයුක්ත විය යුත්තේ ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**6. අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා (අංක 3) :** පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කරන ලද යෝජනාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 112(1)හි විධිවිධානවල සහ 2019 ජනවාරි 24 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවෙහි කුමක් සඳහන්ව තිබුණ ද, 2019 මාර්තු 28 වැනි දින තේරීම් කාරක සභාව විසින් තීරණය කළ පරිදි පහත සඳහන් අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා, විෂය භාර අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයා හෝ අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන අමාත්‍යවරයා සභාපතිවරයා වූ ද, රාජ්‍ය අමාත්‍යවරයා, නියෝජ්‍ය අමාත්‍යවරයා සහ තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන වෙනත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් හත් දෙනෙකුගෙන් (07) සමන්විත විය යුතු ය:—

(i) ආරක්ෂක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව;

(ii) මහවැලි සංවර්ධන හා පරිසර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව;

(iii) ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු,නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව;

(iv) සංචාරක සංවර්ධන, වනජීවී සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව;

(v) බුද්ධශාසන හා වයඹ සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව;

(vi) මුදල් පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව;

(vii) නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව;

(viii) විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව;

(ix) සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව;

(x) විදුලිබල, බලශක්ති සහ ව්‍යාපාර සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව;

(xi) අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව;

(xii) කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන්වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම සහ සමුපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව;

(xiii) මහානගර හා බස්නාහිර සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව;

(xiv) වැවිලි කර්මාන්ත කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව;

(xv) කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව;

(xvi) මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව;

(xvii) රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව;

(xviii) නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව;

(xix) ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව;

(xx) අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව;

(xxi) අධ්‍යාපන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව;

(xxii) වරාය හා නාවික කටයුතු සහ දක්ෂිණ සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව;

(xxiii) විදුලි සංදේශ, විදේශ රැකියා සහ ක්‍රීඩා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව;

(xxiv) සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව;

(xxv) කම්කරු හා වෘත්තීය සමිති සබඳතා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව; සහ

(xxvi) විශේෂ ප්‍රදේශ සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**7. විසර්ජන පනත් කෙටුම්පත — (විසිදෙවැනි වෙන් කළ දිනය) :** කාරක සභාවේදී තවදුරටත් සලකා බලන ලදී.

(කාරක සභාවේදී)

කථානායකවරයා මූලාසනාරූඪ විය.

ශීර්ෂය 157

වැඩසටහන 01 (පුනරාවර්තන වියදම)

ගරු නාමල් රාජපක්ෂ මහතා ඉදිරිපත් කළ යෝජනාව,— "වැඩසටහන රුපියල් 10/- කින් අඩු කළ යුතුය".

(පූ.භා. 10.33 ට නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.)

(පූ.භා. 11.38 ට ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා මූලාසනාරූඪ විය.)

(අ.භා. 1.00 ට නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා මූලාසනාරූඪ විය.)

(අ.භා. 2.07 ට ගරු බිමල් රත්නායක මහතා මූලාසනාරූඪ විය.)

(අ.භා. 3.12 ට ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය මූලාසනාරූඪ වූවාය.)

(අ.භා. 4.00 ට ගරු හර්ෂණ රාජකරුණා මහතා මූලාසනාරූඪ විය.)

(අ.භා. 5.00 ට ගරු වේලු කුමාර් මහතා මූලාසනාරූඪ විය.)

(අ.භා. 6.41 ට කථානායකවරයා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.

ශීර්ෂය 157 වැඩසටහන 01 (පුනරාවර්තන වියදම) වෙනුවෙන් සඳහන්ව ඇති රුපියල් 1,141,210,000 මුදල, උපලේඛනයට ඇතුළත් කළ යුතුය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

වැඩසටහන 01 (මූලධන වියදම)

ශීර්ෂය 157 වැඩසටහන 01 (මූලධන වියදම) වෙනුවෙන් සඳහන්ව ඇති රුපියල් 2,872,250,000 මුදල, උපලේඛනයට ඇතුළත් කළ යුතුය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ශීර්ෂය 204

වැඩසටහන 02 (පුනරාවර්තන වියදම)

ශීර්ෂය 204 වැඩසටහන 02 (පුනරාවර්තන වියදම) වෙනුවෙන් සඳහන්ව ඇති රුපියල් 194,960,000 මුදල, උපලේඛනයට ඇතුළත් කළ යුතුය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

වැඩසටහන 02 (මූලධන වියදම)

ශීර්ෂය 204 වැඩසටහන 02 (මූලධන වියදම) වෙනුවෙන් සඳහන්ව ඇති රුපියල් 94,800,000 මුදල, උපලේඛනයට ඇතුළත් කළ යුතුය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ශීර්ෂය 236

වැඩසටහන 01 (පුනරාවර්තන වියදම)

ශීර්ෂය 236 වැඩසටහන 01 (පුනරාවර්තන වියදම) වෙනුවෙන් සඳහන්ව ඇති රුපියල් 144,140,000 මුදල, උපලේඛනයට ඇතුළත් කළ යුතුය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

වැඩසටහන 01 (මූලධන වියදම)

ශීර්ෂය 236 වැඩසටහන 01 (මූලධන වියදම) වෙනුවෙන් සඳහන්ව ඇති රුපියල් 15,000,000 මුදල, උපලේඛනයට ඇතුළත් කළ යුතුය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ශීර්ෂය 195

වැඩසටහන 01 (පුනරාවර්තන වියදම)

ශීර්ෂය 195 වැඩසටහන 01 (පුනරාවර්තන වියදම) වෙනුවෙන් සඳහන්ව ඇති රුපියල් 235,420,000 මුදල, උපලේඛනයට ඇතුළත් කළ යුතුය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

වැඩසටහන 01 (මූලධන වියදම)

ශීර්ෂය 195 වැඩසටහන 01 (මූලධන වියදම) වෙනුවෙන් සඳහන්ව ඇති රුපියල් 86,250,000 මුදල, උපලේඛනයට ඇතුළත් කළ යුතුය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

වැඩසටහන 02 (පුනරාවර්තන වියදම)

ශීර්ෂය 195 වැඩසටහන 02 (පුනරාවර්තන වියදම) වෙනුවෙන් සඳහන්ව ඇති රුපියල් 342,000,000 මුදල, උපලේඛනයට ඇතුළත් කළ යුතුය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

වැඩසටහන 02 (මූලධන වියදම)

ශීර්ෂය 195 වැඩසටහන 02 (මූලධන වියදම) වෙනුවෙන් සඳහන්ව ඇති රුපියල් 1,701,000,000 මුදල, උපලේඛනයට ඇතුළත් කළ යුතුය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ශීර්ෂය 295

වැඩසටහන 01 (පුනරාවර්තන වියදම)

ශීර්ෂය 295 වැඩසටහන 01 (පුනරාවර්තන වියදම) වෙනුවෙන් සඳහන්ව ඇති රුපියල් 142,000,000 මුදල, උපලේඛනයට ඇතුළත් කළ යුතුය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

වැඩසටහන 01 (මූලධන වියදම)

ශීර්ෂය 295 වැඩසටහන 01 (මූලධන වියදම) වෙනුවෙන් සඳහන්ව ඇති රුපියල් 14,000,000 මුදල, උපලේඛනයට ඇතුළත් කළ යුතුය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ශීර්ෂය 296

වැඩසටහන 01 (පුනරාවර්තන වියදම)

ශීර්ෂය 296 වැඩසටහන 01 (පුනරාවර්තන වියදම) වෙනුවෙන් සඳහන්ව ඇති රුපියල් 64,000,000 මුදල, උපලේඛනයට ඇතුළත් කළ යුතුය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

වැඩසටහන 01 (මූලධන වියදම)

ශීර්ෂය 296 වැඩසටහන 01 (මූලධන වියදම) වෙනුවෙන් සඳහන්ව ඇති රුපියල් 2,000,000 මුදල, උපලේඛනයට ඇතුළත් කළ යුතුය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අනතුරුව සභාපති ප්‍රගතිය වාර්තා කළ යුතුයැයි ද, නැවත රැස්වීමට අවසර ගතයුතු යැයි ද රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

කාරක සභාව ප්‍රගතිය වාර්තා කරයි; නැවත රැස්වීම 2019 අප්‍රේල් 03 බදාදා.

**8. ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝග :** සංවර්ධන උපාය මාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා වෙනුවෙන් රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 1985 අංක 48 දරන හා 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන)

පනතේ 4(3) වගන්තිය සහ 14 වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 20 වගන්තිය යටතේ වාහන වායු විමෝචන ප්‍රමිති සහ ආරක්ෂණ මිනුම්/ ප්‍රමිති සම්බන්ධයෙන් සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 ජනවාරි 25 දිනැති අංක 2107/45 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.02.20 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**9. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2012) :** සංවර්ධන උපාය මාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා වෙනුවෙන් රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,—1978 අංක 4 දරන මහ කොළඹ ආර්ථික කොමිසම පනතේ 31 වගන්තිය යටතේ 2017.10.19 දින ඉදිරිපත් කරන ලද 2012.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**10. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2013) :** සංවර්ධන උපාය මාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා වෙනුවෙන් රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,—1978 අංක 4 දරන මහ කොළඹ ආර්ථික කොමිසම පනතේ 31 වගන්තිය යටතේ 2017.12.07 දින ඉදිරිපත් කරන ලද 2013.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**11. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2014) :** සංවර්ධන උපාය මාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා වෙනුවෙන් රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 1978 අංක 4 දරන මහ කොළඹ ආර්ථික කොමිසම පනතේ 31 වගන්තිය යටතේ 2017.12.07 දින ඉදිරිපත් කරන ලද 2014.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**12. ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2014) :** සංවර්ධන උපාය මාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා වෙනුවෙන් රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 16 වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ II වගන්තිය අනුව 2017.10.20 දින ඉදිරිපත් කරන ලද 2014.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**13. ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2015) :** සංවර්ධන උපාය මාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා වෙනුවෙන් රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 16 වගන්තිය යටතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ II වගන්තිය අනුව 2018.02.21 දින ඉදිරිපත් කරන ලද 2015.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**14. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2016) :** සංවර්ධන උපාය මාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා වෙනුවෙන් රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 1978 අංක 4 දරන මහ කොළඹ ආර්ථික කොමිසම පනතේ 31 වගන්තිය යටතේ 2018.07.04 දින ඉදිරිපත් කරන ලද, 2016.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**15. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2015) :** සංවර්ධන උපාය මාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා වෙනුවෙන් රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 1978 අංක 4 දරන මහ කොළඹ ආර්ථික කොමිසම පනතේ 31 වගන්තිය යටතේ 2018.03.23 දින ඉදිරිපත් කරන ලද, 2015.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**16. කල් තැබීම (කච්චල්සමලන්කුලම් වැව් සම්බන්ධ ප්‍රශ්න) :** "මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදින්, විවාද විය.

"ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය මූලාසනාරූඪ විය යුතුය"යි, කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 6.53 ට ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය මූලාසනාරූඪ වූවාය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය; අ.භා. 7.18 ට, 2019 මාර්තු 09 වැනි දින සභා සම්මතිය අනුව, 2019 අප්‍රේල් 03 වැනි බදාදා පූ.භා. 9.30 වනතෙක් පාර්ලිමේන්තුව කල් ගියේය.